# මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානාහිමි තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත තෙරුන්ගේ ශාස්ත්‍රීය සේවාව හා උන්වහන්සේගේ සඟ පරපුර

කලුන්දෑවේ චන්දවිමල හිමි

## හැඳින්වීම

මහනුවර යුගයේ ආගමික ලෝකය මෙන්ම ශාස්ත්‍රීය ලෝකයේ ප්‍රවර්ධනය කෙරෙහි භික්ෂු ප්‍රජාවගෙන් ලැබුණු දායකත්වය අපමණය. වැලිවිට සරණංකර සංඝරාජ හිමියෝ එහි දී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කළ අතර උන්වහන්සේගේ ශිෂ්‍ය ප්‍රජාව මෙන්ම සමකාලීන භික්ෂු ප්‍රජාව ද ඒ සඳහා මහත් කැප වීමෙන් කටයුතු කළහ. එසේ කැප වූ ශාස්ත්‍රීය උන්නතිකාමී භික්ෂු ගණයා අතර තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත නාහිමි ශ්‍රේෂ්ඨ පඬිරුවණක් ලෙසින් ඉතිහාස ගත වී තිබේ. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ ලේඛකයෙකු වනුයේ ශ්‍රී ලාංකේය ඓතිහාසික රචනා සම්ප්‍රදායේ ගමන් මඟ ආලෝකමත් කළ '**මහාවංසය**' නම් ඓතිහාසික රචනාවේ දිගුවක් වූ කුරුණෑගල යුගයේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජතෙක් වූ කොටස මෙරටට දායාද කිරීම නිසාවෙනි. නූතන ශ්‍රී ලාංකේය ඉතිහාසයේ යුග පුරුෂයෙක් වූ උන්වහන්සේ වෙතින් මෙරට ශාස්ත්‍රීය ලෝකයට මෙන් ම සඟ පරපුරට ඉටු වූ සේවාව සුවිශේෂිත වූවකි. ඒ අනුව මෙම ලිපියෙන් මල්වතු පාර්ශ්වයේ ප්‍රථම මහ නායක යතිවරයාණන් වූ තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත නාහිමි පාණන් වහන්සේ පිළිබඳව මෙන් ම උන්වහන්සේ අතින් සිදු වූ ශාස්ත්‍රීය සේවාව හා උන්වහන්සේ ගෙන් පැවත එන සඟ පරපුරේ ඓතිහාසික විකාශය කවරේ ද යන්න අධ්‍යයනයට ලක් වේ.

### ❖ බුද්ධරක්ඛිත නාහිමි හා උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවාව

මහනුවර රාජධානි සමයේ මෙරට පහළ වූ යුග පුරෂ යෙකු වූ වැලිවිට සරණංකර සඟරාජ හිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය වරයා වූ[1] බුද්ධරක්ඛිත නාහිමියන් මල්වතු මහ විහාරයේ ප්‍රථම මහ නායක පදවිය මෙන් ම උප සඟ රජ පදවිය ද දැරුවේය.[2] එවැනි භාරධූර ක්ෂේත්‍රයන් දෙකක කටයුතු කරමින් උන්වහන්සේ මෙරට සඟ පරපුරට මෙන් ම ශාස්ත්‍රීය ලෝකයට සිදු කළ සේවාව අති විශිෂ්ට වූවකි. වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් බුදුසසුන හා ත්‍රිපිටක ධර්මය නඟා සිටුවීම සඳහා සුවිශේෂිත වූ කර්තව්‍යයන් ගණනාවක් සිදු කරමින් සිටියේ ය. එම කර්තව්‍යයන් අතර විශිෂ්ට ගණයේ එකක් වූයේ ත්‍රිපිටක ධර්මය හා විවිධ දහම් කරුණු අන් තර්ගත පොත් පත් රචනා කිරීමයි. තත් අවධියේ විසූ භික්ෂූන් වහන්සේලා ලේඛනයට එතරම් පටුත්වයක් නොදැක් වූ හෙයින් ඒ සඳහා ඉදිරිපත්ව සිටියේ ඉතා සීමිත පිරිසකි. ඒ සීමිත පිරිස අතුරින් සරණංකර හිමියන්ගේ අපේක්ෂාව ඉහළින් ම ඉටු කිරීමට ඉදිරිපත් වූ ශිෂ්‍යවරයෙකු වූයේ බුද්ධරක්ඛිත හිමියන්ය. උන්වහන් සේට සිංහල, පාලි, සංස්කෘත යන භාෂාත්‍රය පිළිබඳ හසළ දැනු මක් තිබූ හෙයින් භාෂාත්‍රයෙන් ම ග්‍රන්ථ රචනයට පෙළඹී සිටියේ ය.

### ❖ බුද්ධරක්ඛිත හිමියන්ගේ ශාස්ත්‍රීය සේවාව

බුද්ධරක්ඛිත නාහිමියන් සිංහල, පාලි හා සංස්කෘතාදි භාෂා වන් පිළිබඳව හසළ දැනුමකින් යුක්ත වූ බව උන් වහන්සේ විසින් රචනා කළ ග්‍රන්ථ අධ්‍යයනය කිරීමෙන් තහවුරු වෙයි. **සතිපට්ඨාන සූත්‍ර සන්නය, ස්‍යාමොපසම්පදාවත,**[3] **සද්ධම්මොපායනය**[4] හා කුරුණෑගල යුගයේ රජ කළ හතරවන පරාක්‍රමබාහු රජ අවධි යේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ අවධිය තෙක් වූ කාලය ආව රණය කරමින් රචිත **මහාවංසය** ද බුද්ධරක්ඛිත හිමියන්ගේ රචනා වන් ලෙස සලකනු ලැබේ.[5] **සද්ධ ම්මොපායන** කෘතිය බුද්ධරක්ඛිත හිමියන්ගේ ම ස්වෝත්සාහි කෘති යක් නොවන අතර එය අනුරාධ පුර යුගයේ හෝ පොළොන්නරු අවධියේ හෝ රචිත කෘතියක්



බව ඇතැමුන්ගේ අදහස වී තිබේ.[6] එහි සඳහන් වන ආකාරයට එම කෘතිය රචනා කර තිබෙනුයේ 'කවිචක්‍රවර්ති භදන්ත ආනන්ද' තෙරණුවෝය.[7] ''තවද, සඞඝ රාජෝත්තම සාමීන්ගේ ප්‍රධාන ශිෂ්‍ය භූත වූ තිබ්බටුවාවේ බුද්ධ රක්ඛිත සිද්ධාර්ථ නායක සාමී ද, ''සත්‍රා'' යන පදයට **ශ්‍රී සද්ධර් මාවවාද සංග්‍රහ** නම් සද්ධර්ම ප්‍රකරණයක් හා **සතිපට්ඨාන සූත්‍රයට** සන්නයක් ද, **සද්ධම්මොපා යනයට** එළුපොතක් ද, **මහාවංසයේ** අගට කුරුණෑගල් පණ්ඩිත පරාක්‍රම මහ රජ්ජුරුවන් පටන් අප මහරාජෝත්තමයන් දක්වා අභිනව ගාථා අටසියයක් ලියා එකතු කරමින්'' යනුවෙන් සඳහන් වන **සංඝරාජ සාධු චරියාවේ** විස්තර යෙන් ද පැහැදිලි වනුයේ උන්වහන්සේ ග්‍රන්ථ හතරක් රචනා කළ බවය.[8] ඉහත සාකච්ඡාව න්ට අනුව පැහැදිලි වනුයේ **සද්ධම්මො පායන** කෘතියට උන්වහ න්සේ විසින් එළු පොතක් රචනා කර ඇති බවය. **සද්ධර්මාවවා දයේ** එන සඳහනකට අනුව එම ග්‍රන්ථ යේ කතුවරයා බුද්ධරක්ඛිත හිමියන් බව පැහැදිලි වෙයි.[9] **සද්ධර්මා වවාද සංග්‍රහය** බුද්ධරක්ඛිත හිමියන්ගේ ම රචනයක් ලෙස පිළි ගැනෙන අතර රජ කෙනෙකු ගේ යුතුකම් හා රාජධර්ම කවරේදැයි පැහැදිලි කෙරෙන ජාතක කථා රැසක් එහි ඇතුළත්ව ඇති බව මහින්ද සෝමතිලකයන්ගේ අදහසයි.[10] **සද්ධර්මාවවාද සංග්‍රහයේ** ඓතිහාසික තොරතුරු මෙන් ම බණ කථා රැසක් ද අන්තර්ගත හෙයින් මෙම ග්‍රන්ථය ඓති හාසික කෘතියක් මෙන්ම බණ පොතක් ලෙසින් ද හැඳින්විය හැකි ය. බුද්ධරක්ඛිත හිමියන් පාලි, සිංහල හා සංස්කෘත යන භාෂාත්‍රය පිළිබඳව තමා සතු වූ දැනුම භාවිත කරමින් ග්‍රන්ථ හතරක් මෙරට සාහිත්‍යය ලෝකයට දායාද කළ බව ග්‍රන්ථ පරිශීලනයෙන් පැහැ දිලි වෙයි. ඉතිහාසය, බෞද්ධ දර්ශනය හා විවිධ භාෂා පිළිබඳව උන්වහන්සේ සතු වූ කුසලතාව කවරේ ද යන්න ඉහත ග්‍රන්ථ තුළින් ප්‍රකට වෙයි.

### ❖ ඓතිහාසික දෘෂ්ටිය පිළිබඳ උන්වහන්සේගේ දැක්ම හා ශාස්ත්‍රීය ලෝකය

බුද්ධරක්ඛිත හිමියන්ගේ ශාස්ත්‍රීය ලෝකයේ අතිශයින් වැද ගත් හා සම්භාවනාවට ලක් වූ රචනාව වනුයේ කුරුණෑගල යුගයේ සිව්වන පරාක්‍රමබාහු රජ අවධියේ සිට මහනුවර රජ කළ

කීර්ති ශ්‍රී රාජසිංහ අවධිය තෙක් (වසර තුන්සියයක් පමණ) කාලපරිච්ඡේදය ආවරණය කරමින් රචිත **මහාවංස** කෘතියයි. **මහවංසය** යනු ශ්‍රී ලාංකේය ඓතිහාසික රචනා සම්ප්‍රදායේ වැදගත් සන්ධිස්ථානයක් සනිටුවහන් කරනු ලබන ග්‍රන්ථයකි. "මහතා වංසො පවෙණී මහාවංසො"[11] යනුවෙන් බුද්ධාදි මහතුන්ගේ පරම්පරාව **මහාවංසය** යැයි කියනු ලැබේ. **මහාවංසයෙන්** බුද්ධාදි උතුමන්ගේ පරම්පරාව ගැන කියවුන ද නූතන ඉතිහාසඥයෝ **මහාවංසය** ශ්‍රී ලාංකේය ඉතිහාසය හැදෑරීමට ඇති සුවිශේෂිත මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙස සලකති.[12] **මහාවංසය** සාහිත්‍ය කෘතියක් වුව එය මෙරට ඉතිහාසඥයන්ගේ විශ්වසනීය බව දිනාගත් කෘතියකි. ඉතිහාසඥයන්ගේ විශ්වසනීය බව **මහාවංසයට** ලැබී ඇත්තේ එහි එන බොහෝ කරුණු පුරාවිද්‍යාත්මක හා අනෙකුත් සාහිත්‍ය මූලාශ්‍රයන්ගෙන් සනාථ වන හෙයිනි.

සිව්වන පරාක්‍රමබාහු රජුගේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ සමය තෙක් වූ වසර තුන්සියයක් පමණ කාල පරිච්ඡේදයක් ආවරණය කරමින් රචිත **මහාවංසය** තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කළ බව සාමාන්‍ය පිළිගැනීම වේ. විල්හෙම් ගයිගර්ගේ අදහස වනුයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මුල් රාජ්‍ය වසර පහ (ක්‍රි. ව. 1753 තෙක්) ආවරණය කරමින් රචිත කොටස තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කරන්නට ඇති බව ය.[13] **මහාවංසයේ** 98 වැනි පරිච්ඡේදයේ අවසානය තෙක් වූ කොටස බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කරන්නට ඇතැයි යන මතය සාවද්‍ය බව බොහෝ ඉතිහාසඥයන්ගේ අදහස වී තිබේ.[14] **මහාවංසයේ** 98 වන පරිච්ඡේදයේ 137 වන ගාථාවේ සිට එනම් ලක්දිවට සියම් උපසම්පදාව ගෙන ඒමෙන් පසුව කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ උදාර සේවය අළලා ලිවූ කොටස මල්වතු මහාවිහාරයේ ම විසූ සද්ධිවිහාරික භික්ෂු ගණයා හෝ එක් භික්ෂුවක් විසින් හෝ ලියන්නට ඇති බව මංගල ඉලංගසිංහ අදහස් කරයි.[15] ඔහු විසින් සිය කරුණු සනාථ කිරීම සඳහා තර්ක ගණනාවක් ගෙන හැර දක්වා තිබේ. **මහාවංසයේ** 98 වන පරිච්ඡේදයේ 136 වන ගාථාව කීර්ති ශ්‍රී රාජසිංහ රජු විසින් ශාසනයේ අභිවෘද්ධිය සඳහා කරන ලද සේවාවන් අගය කරමින් එතෙක් දක්නට ලැබුණු



රචනා ශෛලිය වෙනස් කරමින් ලියූ ගාථාවකින් අවසන් වෙයි.[16] 98 වන පරිච්ඡේදයේ 137 වන ගාථාවේ සිට දක්නට ලැබෙන රචනා සම්ප්‍රදාය බුද්ධරක්ඛිත හිමියන්ගේ රචනා ශෛලියට වඩා වෙනස් බව පැහැදිලිව දක්නට ලැබෙන කරුණකි. ඒ අනුව උන්වහන්සේ සිය රචනාව 98 වන පරිච්ඡේදයේ 136 වන ගාථාවෙන් අවසන් කරන්නට ඇතැයි සිතිය හැකිය. **මහාවංසයේ** මෙම කොටස බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කළ බව ඉහත දැක් වූ **සංඝරාජ සාධු චරියාවේ** පාඨයෙන් ද තහවුරු වෙයි.[17] ඉහත දක් වූ මූලාශ්‍ර තොරතුරුවලට අනුව පෙනී යනුයේ සිවුවන පරාක්‍රමබාහු රජුගේ රාජ්‍ය අවධියේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය අවධියේ මුල් වසර පහ තෙක් වූ කොටස තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත නාහිමියන් විසින් රචනා කරන්නට ඇති බව ය.

වසර තුන්සියයක් පමණ අනාවරණය නොවී පැවති ශ්‍රී ලංකාවේ ඓතිහාසික සිදුවීම් මූලාශ්‍ර ගණනාවක් ඇසුරු කරමින් බුද්ධරක්ඛිත හිමියන් විසින් **මහාවංසය** ලියා ඇති බව ග්‍රන්ථයේ එන කරුණු තුළින් පැහැදිලි වෙයි. ඓතිහාසික කරුණු ආවරණය කිරීම සඳහා භාවිත කරන ලද මූලාශ්‍ර විවිධත්වය නිසා බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කළ **මහාවංස** කොටස ද ඓතිහාසික අතින් වැදගත් වේ. එම නිසාම කුරුණෑගල යුගයේ සිට මහනුවර යුගය තෙක් ශ්‍රී ලංකාවේ ඉතිහාසය අධ්‍යයනය කරන බොහෝ ඉතිහාසඥයෝ මෙම ග්‍රන්ථය මූලාශ්‍රයක් ලෙසින් පරිහරණය කරති.[18] ඉතිහාසඥයන්ගේ පරිශීලනය සඳහා හේතු වී ඇත්තේ එහි එන බොහෝ කරුණු සමකාලීන මූලාශ්‍රවලින් සනාථ වන හෙයිනි. **මහාවංසය** රචනා කිරීමේ දී බුද්ධරක්ඛිත හිමියන් තුළ පැවති සංයමය, තත් ග්‍රන්ථයේ ඓතිහාසික බව, ග්‍රන්ථය තුළින් හෙළිවන කතුවරයා සතු පාලි භාෂාව පිළිබඳ දැනුම වැනි කරුණු කෙරෙහි අවධානය යොමු කිරීමෙන් උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවය ඇගයීමට ලක් කළ හැකිය. වසර තුන්සියයක පමණ වූ අතීතයක් වර්තමානය වෙත ගෙන එන්නට උන්වහන්සේ යම් ප්‍රයත්නයක් ගෙන තිබෙන අතර එහි ප්‍රතිඵලයක් ලෙසින් **මහාවංසය** මේ අවධියේ දී නැවත ලියවුණි. මෙවැනි ග්‍රන්ථයක් පාළියෙන් රචනා කිරීමට පෙළඹීමෙන් ම

ඉතිහාසය හා පාලි භාෂාව පිළිබඳව උන්වහන්සේ සතු වූ ඥාන යේ පරිචය කවරේ ද යන්න අවබෝධ කරගත හැකිය. බොහෝ විචාරකයන් පෙන්වා දෙන ආකාරයට බුද්ධරක්ඛිත හිමි යන් **මහාවංසය** රචනා කිරීමට පටන් ගෙන තිබෙනුයේ කුරුණෑ ගල යුගයේ රජ කළ සිව්වැනි පරාක්‍රමබාහු රජ අවධියේ සිටය.

''තස්සාතිජාතො පුත්තො සො පරක්කමභුජො'පි ච
ධීරො වික්කමසම්පන්නො ආසි තස්මිං පුරෙ වරෙ''[19]

මේ ආකාරයෙන් සිය රචනාව පටන් ගන්නා කතු හිමියන් සිය ලේඛනය සඳහා විවිධ මූලාශ්‍ර ඇසුරු කරමින් මෙයට පෙර **මහාවංසය** ලියවුණු ආකාරයෙන්ම රචනා කරන්නට යෙදුණු බව ග්‍රන්ථ පරිශීලනයෙන් තහවුරු වෙයි.

**මහාවංසයේ** පෙර කතුවරු අනුගමනය කළ ක්‍රමවේදය තවදුරටත් ඉදිරියට ගෙන එමින් රජවරුන්ගේ රාජ්‍යප්‍රාප්ති සිදු වූ ආකාරය, ඔවුන්ගේ ශාසනික ක්‍රියාවන්, ඔවුන්ගේ සමාජ සුභසාධනයන්, මෙන්ම රජවරුන්ගේ යහපත් හා අයහපත් ගති ලක්ෂණ ඉස්මතු කරලීමට කතුවරයා උනන්දු වී තිබෙන බව රජ වරුන්ගේ ජීවන තොරතුරු ගෙනහැර දැක්වෙන කරුණුවලින් පැහැදිලි වෙයි.[20] **මහාවංසයේ** පළමු කොටසින් දුටුගැමුණු රජු ද, දෙවැනි කොටසින් පළමුවන පරාක්‍රමබාහු රජු ද, තෙවන කොටසින් දෙවන පරාක්‍රමබාහු වැනි රාජ චරිත වීර චරිත ලෙසින් ඇගයීමට ලක්වෙන අතර බුද්ධරක්ඛිත හිමියන් රචනා කළ කොට සෙහි වීර චරිත වනුයේ රාජාධිරාජසිංහ හා කීර්ති ශ්‍රී රාජසිංහ යන රාජ චරිතයන්ය. 97 වන පරිඡේදයෙන් එන ගාථා 186 ම වෙන් කර ඇත්තේ රාජාධිරාජසිංහ රජු හා ඔහුගේ ආගමික සමාජ කාර්ය යන් වර්ණනා කිරීම සඳහාය.[21] රාජාධිරාජසිංහ රජු සිංහල පාලකයෙකු වශයෙන් මෙරට ශාසනික ඉතිහාසයට සුවි ශාල කාර්ය භාරයක් ඉටු කළ නරේශ්වරයෙකි. එනිසාම තත් රාජ චරිතය බුද්ධරක්ඛිත හිමියන්ගේ ද සිත් ගන්නට ඇතැයි ග්‍රන්ථය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වෙයි. සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමි යන් ජීවත් වූයේ කීර්ති ශ්‍රී රාජසිංහ රජ අවධියේ දී ය. නමුත් උන්වහන්සේ කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ සම්පූර්ණ කාලපරිච්ඡේදය ආවරණය



කරමින් රචනා නොකළ බව උගතුන්ගේ පිළිගැනීම වේ.[22] ඒ බව 98 වන පරිච්ඡේදයේ 136 වන ගාථාවෙන් පැහැදිලි වන අතර එම ගාථාව මෙයට පෙර අනුගමනය කළ ආශිර්වාදාත්මක පාළි ගාථා වන්ට වඩා වෙනස්ය.

''ලොකහිතො මනුජාධිපරාජා සාසනවුද්ධි කතො ඉති එවං
බ්‍රහ්මසුරාසුරසෙසපතීතා තං මහිංපං සිරිආයු දදන්තු.''[23]

මෙම ගාථාව අවසන් කර ඇත්තේ රජුගේ මරණයෙන් පසුව කරනු ලබන දෙව් මිනිස් සැප පිළිබඳ සඳහන් කිරීමකින් නොවන අතර ඔහුට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කිරීමකින්ය. ඉහත ගාථාව සම්බන්ධයෙන් අවධානය යොමු කරන උගතුන්ගේ අදහස වී ඇත්තේ තත් ගාථාවෙන් බුද්ධරක්ඛිත හිමියන්ගේ **මහාවංස** රචනාව අවසන් වූ බවයි.[24] නමුදු එතෙක් රචිත කොටසේ දී වුව බුද්ධරක්ඛිත හිමියන් කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ කාර්යයන් පිළිබඳව වර්ණනාත්මක විස්තරයක් කරන්නට අමතක කර නැති බව ග්‍රන්ථයේ එන කරුණු දෙස බැලීමෙන් තහවුරු වෙයි.

බුද්ධරක්ඛිත හිමියන් විසින් රචනා කරන්නට යෙදුණු **මහා වංස** කොටසෙහි ඓතිහාසික දෘෂ්ටිය පිළිබඳ විමසීම තුළින් උන් වහන්සේ තුළ ඉතිහාසය සම්බන්ධයෙන් තිබූ ප්‍රාමාණිකත්වය කවරේ ද යන්න අවබෝධ කරගත හැකිය. සීතාවක රාජ්‍යයේ රාජ්‍යප්‍රාප්ත පළමුවන රාජසිංහ රජු ශ්‍රී ලංකා ඉතිහාසයේ වැදගත් පාලකයෙකි. ඔහු වැදගත් වනුයේ එකල පෘතුගීසි බලයෙන් ශ්‍රී ලංකාව නිදහස් කර ගැනීම සඳහා කැප වූ පාලකයෙක් වශයෙනි. ජයවර්ධනපුරයෙන් බෞද්ධ බලය ගිලිහී යන විට එම බලය සීතාවක වෙත විතැන් කොට බෞද්ධ බලවේගයන්ට නායකත්වය දීමෙන් ඔහුගේ පියා මෙන්ම ඔහු ද ජනාදරයට පත් වුණි. සිය පියා ජීවත්ව සිටියදී ම ඔහු බෞද්ධ ජනයාගේ නායකයා ලෙසින් පෙනී සිටියේ ය. නමුත් ඔහු රාජ්‍යත්වයට පත් වූයේ පියා ඝාතනය කිරීමෙන් පසුවය. ''ඝාතෙත්වා සකභත්ථෙන රජ්ජමග්ගහි දුම්මති''[25] යනුවෙන් **මහාවංසය** එය සඳහන් කරයි. පිතෘ ඝාතක පාලකයන්ට **මහාවංස** රචනය තුළ ඉඩක් ලැබුණේ නැත. භික්ෂූන් වහන්සේලා එවැනි පාලකයන් හැම විටම ප්‍රතික්ෂේප කළ බව

ඉතිහාසය සාක්ෂි සපයයි.[26] පළමු රාජසිංහයන් ද මුලදී බුදුදහම වෙනුවෙන් කැප වූයේ නමුත් පිතෘ ඝාතනයෙන් පසුව භික්ෂූන් වහන්සේලා ඔහුව දුරස්කළහ. මේ නිසා ඔහු ශිව ආගම වැළඳ ගෙන බුදුසසුනට මහත් විනාශයක් සිදු කළ අතර භික්ෂූන් වහන්සේලා සතු වූ 'සමන්ත කූටය' පවා ශිවාගමිකයන් අතට පත්කරන්නට යෙදුණි. මෙවැනි කටයුතු නිසා ඔහු සංඝයා වහන්සේලා අතර මෙන්ම මෙරට බෞද්ධයන් අතර අපකීර්තියට පත් වූ බව පැහැදිලිය. මේ අපකීර්තිමත් බව බුද්ධරක්ඛිත හිමියන් ජීවත් වූ අවධියේ ද රජු කෙරෙහි පවතින්නට ඇති බව පළමු රාජසිංහයන් පිළිබඳව ලියා ඇති කරුණු තුළින් ගම්‍ය වෙයි.[27] බුද්ධරක්ඛිත හිමියන් ඔහු පිළිබඳව වාර්තා කර ඇත්තේ සුභවාදීව නොවේ. ඔහු පෘතුගීසීන්ට විරුද්ධව කරන ලද සටන් පිළිබඳව හෝ බුදුසසුන වෙනුවෙන් කරන ලද අනුග්‍රහයන් පිළිබඳව සඳහන් කිරීමට හෝ කතුවරයා උනන්දු වූ ආකාරයක් දක්නට ලැබෙන්නේ නැත. බෞද්ධ භික්ෂූන් වහන්සේ කෙනෙකු ලෙසින් උන්වහන්සේ පළමු රාජසිංහයන් දෙස බලන්නේ පිතෘ ඝාතක, බුදුසසුනට මහත් විනාශයක් කළ පාලකයෙකු යන ආකල්පයෙනි. එනිසාම උන්වහන්සේ රාජසිංහයන්ගේ අවසානය පිළිබඳව සඳහන් කර ඇත්තේ ''කත්වා සො සකලං අපුඤ්ඤනිචයං මාරස්ස හත්ථං ගතො'' යනුවෙනි.[28] ඕනෑම චරිතයක හොඳ මෙන්ම නරක යන ලක්ෂණ දෙකම තිබිය හැකිය. ඉතිහාසඥයෙකු නම් ඒ කරුණු දෙක කෙරෙහි ම අවධානය යොමු කළ යුතුය. කවරෙකුට හෝ පක්ෂපාති වීම ඉතිහාසඥයෙකුගේ ලක්ෂණය නොවේ. නමුත් මෙහි දී බුද්ධරක්ඛිත හිමියන්ගේ දෘෂ්ටිය බෞද්ධ භික්ෂුවකගේ චින්තනයෙන් ලිය වී ඇති බව කිව යුතුය. රාජසිංහ රජු මුල දී සංඝයා සමග එකතුව බුදුසසුනට වැඩ කළ බව සඳහන් කිරීමට උන්වහන්සේ අමතක කර නැත. නමුත් ඒ සඳහා වෙන්ව ඇත්තේ එක් ගාථාවක් පමණි.[29]

පළමු රාජසිංහ රජු බුදුසසුනට කළ විනාශය කවරේද යන්න මෙරට ශාසනික ප්‍රවෘත්ති කියන **ස්‍යාමොපසම්පදාවත** නම් සිය කෘතියේ දී ''ඔහු රජුහුගේ සිත් ලෙස කී වචන අසා ඔවුන් කෙරෙහි පැහැදැ චිරකාලානුගත උතුම් සම්‍යග්දෘෂ්ටිය හැරැ අළුගා මිථ්‍යාදෘෂ්ටිය ගෙනැ බුද්ධ ශාසනයට විරුද්ධ වැ බොහෝ කලෙකැ පටන් අවිච්ඡින්නවැ පැවති පොත්පත් හා මහා ස්ථවිරාදි මහා සංඝයාත් නසා සමනොළ උපදනා ලාබයත්, ආඬින්ට පමුණුවා දී රාජ පරම්පරාගත වූ රන් රිදී ආදී බොහෝ වස්තු නොගත හැකි සේ නැවි ගත කරවා, විනාශ කොටැ අධර්මයෙන් රාජ්‍යය කොටැ අවීචියෙහි උපන්හ.''[30] යනුවෙන් සඳහන් කළේය. වංසකථාවේ දී පළමු රාජසිංහ රජු පිළිබඳව දැක් වූ දෘෂ්ටිය ඒ ආකාරයෙන් ම මෙරට ශාසනික ප්‍රවෘත්ති ගෙනහැර දැක් වූ **ස්‍යාමොපසම්පදාවත** නම් කෘතියේ දී ද දක්වා තිබෙන බව මෙයින් පැහැදිලි වෙයි. තත් අවධියේ ශ්‍රී ලාංකේය සමාජයේ පැවති සාමාජික දෘෂ්ටිය මේ ආකාරයෙන් උන්වහන්සේ අතින් රචනා වන්නට ඇතැයි සිතිය හැකිය. **මහාවංසයේ** හා **ස්‍යාමොපසම්පදාවේ** එන මේ විස්තරයෙන් සමාජයට ලබා දෙන වැදගත් පණිවිඩය වනුයේ මිථ්‍යා දෘෂ්ටික පාලකයන්ට මෙරට සමාජයේ ඉඩක් නොලැබෙන බව ඒත්තු ගැන්වීමයි. මෙම සමාජ දෘෂ්ටිය මහනුවර පාලකයන්ට ද දැඩිසේ බලපෑම් කරන්නට ඇතැයි කල්පනා කළ හැකිය.

අතීතයේ දළදා වහන්සේ උදෙසා විවිධ පූජා චාරිත්‍රයන් සිදු කළා මෙන්ම ඒ වෙනුවෙන් විවිධ ග්‍රන්ථ ද රචනා විය. අනුරාධපුර යුගයේ කිත්සිරිමෙවන් රජුගේ අවධියේ සිටම දළදා පෙරහැර ද පැවැත් වූ බවට සාධක පවතී. ඒ බව **මහාවංසය,**[31] **දාඨාවංසය,**[32] **ෆාහියන් වාර්තාව**[33] වැනි සාහිත්‍යය මූලාශ්‍රයෝ සාක්ෂි සපයති. මහනුවර යුගයේ දී දළදා පෙරහැර හා දේවාල පෙරහැර පැවැත් වූ ආකාරය කවරේ ද යන්න අධ්‍යයනය කිරීමට ඇති කදිම මූලාශ්‍ර ග්‍රන්ථය වනුයේ **මහාවංසයයි**. එහි සඳහන් විස්තරයන්ට අනුය නාථ, උප්පලවණ්ණ ආදි දෙවිවරුන් උදෙසා පවත්වනු ලබන පෙරහැරේ දී විවිධ නැටුම් කණ්ඩායම් අතර නොයෙක් ස්ත්‍රී සමූහයා ද පෙරහැරෙහි ගමන් ගත් බවට සාධක හමු වෙයි.[34] පෙරහැරට ස්ත්‍රීන්ගේ සහභාගිත්වය පසු කලක අඩුව පැවතුන ද නූතනය වන විට එය ක්‍රමයෙන් වර්ධනය වෙමින් පවතී. ඒ අනුව මහනුවර යුගයේ දී බාධාවකින් තොරව කාන්තාවන් එම උත්සව අවස්ථාවට සහභාගි වූ බව වංසකථාවේ එන

තොරතුරුවලින් තහවුරු වෙයි. මෙම කරුණ ඓතිහාසික අතින් වැදගත් කමකින් අනූන වූවක් ලෙස සැලකිය හැකිය. **මහාවංසයේ** 97 වන පරිච්ඡේදයේ දී රාජාධිරාජසිංහ අවධියේ දළදා පෙරහැර පැවති ආකාරයත්, දළදා වහන්සේ වැඩමෙවූ ආකාරයත් රජු හා ඇමති ගණයා පෙරහැරේ ගමන් කළ ආකාරයත් ඉතා මැනවින් විස්තර කර තිබේ.[35] මෙම විස්තර කථනය දළදා පෙරහැරෙහි ක්‍රම වේදය, චාරිත්‍ර වාරිත්‍ර හා රජය විසින් එයට දැක්විය යුතු අනුග්‍රහය කවරේද යන්න අධ්‍යයනය කරන්නවුන්ට අතිශයින් වැදගත් වෙයි.

අඹු දරුවන් පෝෂණය කරන, ගිහියන්ට අයත් කටයුතු කරන, නැකැත්, වෙදකම් ආදි කටයුතුවල නියලී සිටිය දුසිල්වත් භික්ෂු පිරිසක් මහනුවර යුගයේ එක් කාලපරිච්ඡේදයක ජීවත් වූ බව වංසකථාවේ සඳහන්ව තිබේ.[36] Robert Knox (රොබට් නොක්ස්) ට අනුව තත් අවධියේ 'තෙරුන්වහන්සේලා හා ගණින් නාන්සේලා' වශයෙන් භික්ෂු කණ්ඩායම් දෙකක් විය.[37] මෙම විස්ත රයන්ට අනුව සිල්වත් හා දුසිල්වත් යැයි භික්ෂු කණ්ඩායම් දෙකක් මහනුවර යුගයේ විසූ බව අවබෝධ කරගත හැකිය. මේ දුසිල්වත් ගණින්නාන්සේලා පිළිබඳව මූලාශ්‍ර ගණනාවකම සඳහන් වෙයි. කීර්ති ශ්‍රී රාජසිංහයන්ට කතිකාවතක් පවා සම්පාදනය කරන්නට වූයේ මේ පිරිස නිසා බව ''ක්‍රමක්‍රමයෙන් පිරිහී ගොස් සියලු ලක්දිව සමහර ලජ්ජිපේශල ශික්ෂාකාමී තැන් හැර සෙසු බොහෝ දෙන නක්ෂත්‍ර වෛද්‍යකර්මය යක්ෂප්‍රලය ආදි වූ බුදුන් වහන්සේ විසින් එපාකර වදාළ නින්දිත ශාස්ත්‍ර ඉගැන්මෙන් රාජ රාජ මහා මාත්‍ය සේවනයෙන් ග්‍රාමක්ෂේත්‍රාදි තනතුරු ලබාගැන්මෙන් ගොවි තැන් වෙළඳාම් ආදි වූ නොයෙක් අකර්තව්‍යයෙහි යෙදී ඤාති කුලසංඝයව පුත්‍රදාර පෝෂණශීලීව ශාසන පිළිවෙත් පිරිහී ගොස් විනාශමුඛ ප්‍රාප්තව සිටිකල්හි''[38] යන පාඨයෙන් ඒ බව සනාථ වෙයි. මෙම සමකාලීන මූලාශ්‍ර තුළින් ද **මහාවංසයේ** එන කරුණ සනාථ වෙයි.[39] එම නිසා ශ්‍රී ලාංකේය ඉතිහාසය අධ්‍යය නයේ දී මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙසින් **මහාවංසයට** වැදගත් තැනක් හිමි වෙයි.

රාජාධිරාජසිංහ රජතුමාට නොදෙවෙනි ආකාරයෙන් කීර් -ති ශ්‍රී රාජසිංහ රජුගේ ශාසනික කටයුතු සඳහන් කරන්නට බුද්ධ රක්ඛිත හිමියන්ගේ අවධානය යොමු වී තිබේ. කීර්ති ශ්‍රී රාජසිංහ



රජු පරිහානියට පත්ව තිබූ මෙරට භික්ෂු සංස්ථාවට සියම් උපසම් පදාව ලබා දෙමින් භික්ෂු ශාසනය නගා සිටුවීම සඳහා මහත් වෙහෙසක් ගෙන කටයුතු කළේය. ඒ අනුව සරණංකර සංඝරාජ හිමියන්ගේ ඉල්ලීමට අනුව සියම් රටට දූත ගමන් කිහිපයක්ම යැවීය. එසේ ගිය දූතගමන්හි ප්‍රතිඵලයක් වශයෙන් සියම් රටින් වැඩමෙව් උපාලි හිමියන් ප්‍රමුඛ සිල්වත් භික්ෂු ප්‍රජාවගේ ප්‍රධානත් වයෙන් පුෂ්පාරාමයෙහි වූ මනරම් උපොසථාගාරයේ දී උපසම් පදා මහොත්සවය පැවැත් වූ බවට **මහාවංසය** වාර්තා කරයි. මෙම කටයුත්ත බුද්ධ පරිනිර්වාණයෙන් ''ඞිසහසසසතදූවෙ ඡනනවුති භායනෙ'' දෙදහස් දෙසීය අනූ හයවන වර්ෂයේ ඇසළ මස පෙහෝ දවසේ සිදූ වී තිබේ.[40] මෙම කරුණ ඓතිහාසිකමය අතින් අතිශයින් වැදගත්ය. එනම් පරිහානියට පත්ව තිබූ ශ්‍රී ලංකාවේ බුදුසසුනට නව උද්දීපනයක් ලබා දෙමින් සියම් උපසම් පදාව ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කරනුයේ මේ වර්ෂයේ දී ය. එය නිශ්චිත දින වකවානු සහිතව **මහාවංසයේ** සඳහන් කිරීම සියම් උපසම්පදාවේ ඉතිහාසය සොයා යන්නවුන්ට මහත් ආලෝකයක් ලබා දීමක් වෙයි. මෙම සිද්ධිය **ස්‍යාම වණ්ණනාවේ** ද සඳහන් වන අතර එයින් **මහාවංසයේ** එන කරුණ තව දුරටත් සනාථ වෙයි. 'ශතවර්ෂ එක්දහස් සසිය සැත්තෑපහට පැමිණි වර්ෂයේ ඇසළ මස පුර පසළොස්වක'' දින උපසම්පදා උත්සවය සිදූ කළ බව එහි සඳහන් වෙයි.[41] මේ ආදි වූ ඓතිහාසික තොරතුරු වාර්තා කර ඇති හෙයින් බුද්ධරක්ඛිත හිමියන් විසින් රචිත **මහාවංස** කොටස ද ඓතිහාසික බවින් අනූන බව කිව යුතුය.

**ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය** නම් කෘතිය ද බුද්ධරක්ඛිත නාහිමියන්ගේ ශාස්ත්‍රීය ලෝකය ආලෝකමත් කළ ග්‍රන්ථයක් ලෙස සැලකිය හැකිය. නව අරහාදි බුදුගුණ අතුරින් 'සත්ථා'[42] යන පදය මුල් කරගෙන මෙම ග්‍රන්ථය සම්පාදිතය. එය සිංහල භාෂා වෙන් රචනා කරන ලද්දක් වන අතර බුද්ධරක්ඛිත නාහිමියන්ගේ සිංහල හා පාලි භාෂා ඥානය මෙන්ම ධර්මඥානය කවරේද යන්න තත් ග්‍රන්ථයෙන් ප්‍රකට වෙයි. මෙම ග්‍රන්ථයේ කතුවරයා සිද්ධාර්ථ බුද්ධරක්ෂිත නාහිමියන් ම බව ''සාධුගුණ සමන්විත, ජිනශාසනරත්නාකරයෙහි, ...... සිද්ධාපථ බුද්ධරක්ෂිත ...... මහා ස්ථවි

රයන් වහන්සේ ...... නවගුණපදයන් අතුරෙන් 'සත්‍ථා' යන අක්ෂර ද්වයෙන් ප්‍රතිමණ්ඩිත වූ පදය ගෙන ශ්‍රී බුද්ධ වර්ෂයෙන් දෙදාස් තුන්සිය සොළොස් වන්නෙහි, මේ **ශ්‍රී සද්ධර්මවාද සංග්‍රහය** නම් වූ ධර්මප්‍රකරණය කොට සම්පූර්ණ කළ සේක."[43] යන ඡේදයෙන් පැහැදිලි වෙයි. **ශ්‍රී සද්ධර්මවාද සංග්‍රහය** සිංහල භාෂාවෙන් රචනා කරන ලද්දක් බවත් එය ධර්මයට කරන ලද ප්‍රකරණයක් බවත් ග්‍රන්ථයේ ම එන පහත සඳහන් "පළමුවෙනි ධර්මානිශංසවර්ණනා ......සාමාන්‍ය සද්ධර්මානුශාසනා පරිච්ඡේදය මෙසේ තෙළෙසක් පමණ පරිච්ඡේදයන්ගෙන් ප්‍රතිමණ්ඩිත වූ **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහ** නම් ධර්මප්‍රකරණයක් හෙළු බසින් දක්වම්හ" යන ඡේදයෙන් සනාථ වෙයි.[44] මෙම ග්‍රන්ථය කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍ය කාලයේ බුද්ධරක්ඛිත හිමියන්ගේ අවසාන අවුරුද්දේ දී (ක්‍රි. ව. 1773) ලියන ලද්දක් බව **සිංහල සාහිත්‍ය වංශයේ** සඳහන් වෙයි.[45] ග්‍රන්ථයේ එන වර්ෂයත් සියම් උපසම්පදාව ගෙන ආ වර්ෂය හා සැසඳීමේ දී සන්නස්ගලගේ මතය නිවැරදි බව පෙනේ.[46] **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය** නම් කෘතිය; **බුත්සරණ, අමාවතුර, පූජාවලිය, සද්ධර්මරත්නාවලිය,** වැනි බණ කීමේ ශෛලිය අනුගමනය කරමින් රචිත ග්‍රන්ථයක් ලෙස ඇතැම්හු පෙන්වා දෙති.[47] **පූජාවලිය, සාරාර්ථ සංග්‍රහය** වැනි ග්‍රන්ථ **සද්ධර්මාවවාද සංග්‍රහයට** ගුරූපදේශ වූ බව සන්නස්ගල මහතාගේ ද අදහසයි.[48] ඉහත සඳහන් කළ පැරණි ගද්‍ය කෘතීන් පිළිබඳ ලුහුඬු විස්තරයක් **සද්ධර්මාවවාද** ග්‍රන්ථයේ ද සඳහන් වෙයි.[49] ග්‍රන්ථයේ එන විස්තරයෙන් ඉහත ලේඛකයන්ගේ මතය වඩාත් තහවුරු වෙයි. ග්‍රන්ථයේ ම සඳහන් කරුණුවලින් හා අනෙකුත් පැහැදිලි කිරීම්වලට අනුව පෙනීයනුයේ බුද්ධරක්ඛිත නාහිමියන් විසින් **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය** 'සත්‍ථා' ගුණය මුල් කරගෙන, ධර්ම දේශනා ශෛලිය අනුගමනය කරමින් කීර්ති ශ්‍රී රාජසිංහ සමයේ ලියන්නට යෙදුණු බව ය.[50]

**බුත්සරණ, අමාවතුර, සද්ධර්මරත්නාවලිය** වැනි ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන උපමා භාවිත කරමින් ධර්මය පැහැදිලි කිරීමේ ක්‍රමවේදයක් බුද්ධරක්ඛිත හිමියන් විසින් **සද්ධර්මාවවාද සංග්‍රහයේ** දී අනුගමනය කර තිබේ. එහි දී උන්වහන්සේ සමාජය



තුළ දක්නට ලැබෙන සාම්ප්‍රදායික උපමාවන් මෙන්ම සිය ජීවිත අත්දැකීමෙන් ලද පන්නරය ඔස්සේ නිර්මාණය කළ උපමාවන් ද භාවිත කරමින් දහම් කරුණු පැහැදිලි කරන්නට යෙදුණි. "ජීවිතය අනිත්‍යය විදුලියක් දියබුබුලක් මෙන් අස්ථිරය"[51] "පක්ෂසෙවීමෙන් නොනැමෙණ වජ්‍ර පර්වතයක් මෙන් ඍජුව"[52] වැනි උපමාවන් සේම "මව පස්සෙහි යන්නා වූ පක්ෂි පෝතකයන් සේ ගම්හි ඉපැද වැඩී පැවිදිව යන කල"[53] වැනි උපමාවන් උන්වහන්සේගේ උපමා ගෙනහැර දැක්වීමේ කෞශල්‍යය විදහා දක්වයි. උපමා රූපක යෙදීමේ ද හසළ දැනුමක් උන්වහන්සේ සතු වූ බව "සිතුම්නිරුවනක් වැනි වූ සීල නමැති ආභරණ පැළඳ, සිඟාවල ඳන බතක් වැනි නිරවද්‍ය බතක් වලඳන්නා වූ පාංසුකූල චීවරය වැනි නිරවද්‍ය සිවුරක් පොරවන්නා වූ බුදුන් වැනි උතුම් පියාන කෙනෙකුන් ලද්දා වූ,"[54] වැනි රූපක භාවිත කිරීමෙන් පැහැදිලි වෙයි. මෙවැනි යෙදුම් ගණනාවක් ග්‍රන්ථය පුරාම පාහේ දක්නට ලැබේ.

උන්වහන්සේට පැරණි ශ්‍රී ලාංකේය ඉතිහාසය පිළිබඳව ප්‍රාමාණික දැනුමක් තිබුණු බවට මෙම ග්‍රන්ථය සාක්ෂි සපයයි. මහින්දාගමනයේ සිට මහසෙන් රජ අවධිය තෙක් වූ ශ්‍රී ලාංකේය ඓතිහාසික කරුණු මේ ග්‍රන්ථයට ඇතුළත් කරලීමට උන්වහන්සේ යම් උත්සාහයක් ගෙන තිබේ. උන්වහන්සේගේ පරමාර්ථය ඉතිහාසය ගෙනහැර දැක්වීම නොවූවත් පැරණි රජවරුන්ගේ තොරතුරු හා ඔවුන්ගේ ආගමික කටයුතු කවරේ ද යන්න කියා පෑමට මෙවැනි තොරතුරු ඇතුළත් කළේ යැයි සිතිය හැකිය.[55] එම කරුණු **මහාවංසයේ** මුල් කොටසින් ලබාගත් බව පැහැදිලිය. ඉතිහාසය පිළිබඳව යම් දැනුමක් උන්වහන්සේ සතු වූ වා සේම ඓතිහාසික මූලාශ්‍ර පිළිබඳව ද උන්වහන්සේගේ දැනුම ප්‍රාමාණික ය. හෙළටුවා පිළිබඳව සිය කෘතියේ දක්වන විස්තරය එයට කදිම නිදසුනක් වෙයි. "සිංහල භාෂාවෙන් ලිවූ **මහ අටුවා කථාව ද, මහාපච්චරිය** නම් අටුවා කථාව ද **මහා කුරුන්දිච්ඨ** කථාව දැයි යන මේ අටුවා පොත් තුන සිංහල අටුවා නම් වන්නාහුය. එයින් මහා අටුවා කථාව නම් ප්‍රථම මහා ධර්ම සංගීතියට ඇතුළත් වන හෙයින් මහා අටුවා කථා නම් විය."[56] ආදි වශයෙන් හෙළ අටුවා

පිළිබඳ විස්තර කථනයක් එහි ඇතුළත්ව ඇත. හෙළටුවා පිළිබඳව පමණක් නොව පාළි අට්ඨකථා හා පොළොන්නරු යුගයේ දී රචිත ටීකා ග්‍රන්ථ පිළිබඳව ද දිගු විස්තරයක් ග්‍රන්ථයේ ඇතුළත් වෙයි.[57] අට්ඨකථා හා ටීකා ග්‍රන්ථ පිළිබඳව කර තිබෙන මේ විස්තර කථනයෙන් මූලාශ්‍ර පිළිබඳව මනා පරිචයක් උන්වහන්සේ සතු වූ බව කිව හැකිය. එසේම පාලි භාෂාව පිළිබඳව උන්වහන්සේ සතු වූ හැකියාව ද එයින් පිළිබිඹු කෙරේ. සංස්කෘත භාෂාව පිළිබඳව කතුවරයා සතු හැකියාව ග්‍රන්ථය පුරාම පාහේ දක්නට ලැබෙන අතර එම භාෂාව මැනවින් භාවිත කර ඇති කොටස වනුයේ බුදුන් වහන්සේ පිළිබඳව එන වර්ණනයකදීය.[58] කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ ආරාධනයෙන් රචිත මෙම බණ පොත ගැඹුරු ධර්ම කරුණු විවරණය කරමින් රචිත ග්‍රන්ථයකි. බණ කියන හැටි හා ධර්ම කරුණු විවරණය කළ අවස්ථා ගණනාවක් ග්‍රන්ථය තුළ වෙයි.[59] මෙවැනි කරුණු **සද්ධර්මාවවාදයෙහි** අන්තර්ගතව ඇති හෙයින් බණ කියන ආධුනික කථිකයන්ට මූලාදර්ශයක් සපයන කෘතියක් මෙන්ම ධර්මය පිළිබඳව ගැඹුරින් අධ්‍යයනය කරන්නවුන්ට හා ශ්‍රී ලංකාවේ ශාසනික තොරතුරු සොයන විද්‍යාර්ථීන්ට කදිම මූලාශ්‍ර ග්‍රන්ථයක් ලෙසින් ද ඇගයීමට ලක් කළ හැකිය.

**ස්‍යාමොපසම්පදාවත** නම් ග්‍රන්ථය ද බුද්ධරක්ඛිත හිමියන්ගේ ම කෘතියක් ලෙස සැළකේ. කොටස් දෙකකින් යුත් එය කුඩා ගද්‍ය කාව්‍යයකි. දේවානම්පියතිස්ස රජුගේ අවධියේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජ අවධිය තෙක් වූ ශාසනික ප්‍රවෘත්ති ඇතුළත් කොට එය රචනා කර තිබේ. දේවානම්පියතිස්ස අවධියේ සිට ගම්පොළ අවධිය තෙක් වූ ශාසනික ප්‍රවෘත්ති **නිකාය සංග්‍රහය** හෙවත් **ශාසනාවතාරයෙන්** ලබාගෙන ඇති බව පැහැදිලිය.[60] කෝට්ටේ යුගයේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජගේ රාජ්‍යයේ කාලය තෙක් රචිත කොටස බුද්ධරක්ඛිත හිමියන් විසින් ම රචනා කරන්නට යෙදුණු **මහාවංසයෙන්** ම කරුණු ගෙන රචනා කර තිබෙන බව සන්නස්ගල මහතාගේ අදහසයි.[61] පළමු රාජසිංහ රජු පිළිබඳව **ස්‍යාමොපසම්පදාවතේ** එන සඳහනින් ඒ බව තහවුරු වෙයි.[62] මෙම ග්‍රන්ථයේ දෙවන කොටස සියම් දූත මෙහෙවරෙහි යෙදුණු



විල්බාගෙදර නිලමේගේ ආරාධනයෙන් **ශ්‍යාමවර්ණනාවෙහි** ඇතුළත් කරුණු පිඬු කොට පළමු විමලධර්මසූරිය රජ පටන් කීර්ති ශ්‍රී රාජසිංහයන්ගේ අවසානය තෙක් මෙරට ශාසනික පුවත් ඇතුළත්ව රචනා කරන්නට වූ බවත් සන්නස්ගල මහතා අදහස් කරයි.[63] මෙරට ශාසනික ඉතිහාසය පිළිබඳව, ධර්මය පිළිබඳව මෙන්ම විවිධ භාෂා ශාස්ත්‍රයන් පිළිබඳව උන්වහන්සේ සතු වූ දැනුම මේ ග්‍රන්ථයෙන් පිළිබිඹු වෙයි. මෙරට ශාසනික ප්‍රවෘත්ති සම්පාදනය කිරීම සඳහා උත්සාහ ගන්නා කතුවරයා ඒ සඳහා සිංහල භාෂාව ඉතා දක්ෂ ලෙස හැසිර වීය. සිංහල භාෂාව චතුර ලෙස හැසිර වීමේ පටුත්වය කවරේද යන්න එම ග්‍රන්ථයේ 27 - 28 පිටුවලින් පෙන්නුම් කෙරේ.[64] මෙම ග්‍රන්ථයේ එන කරුණු අධ්‍යයන කිරීමෙන් පැහැදිලි වනුයේ එය ගම්පොළ යුගයේ රචිත **නිකාය සංග්‍රහය** හා සමානව මෙරට ශාසනික පුවත් කියන ඓතිහාසික මය කෘතියක් බවය.

**සතිපට්ඨාන සූත්‍ර සන්නය** හා අභයගිරි විහාරවාසී ආනන්ද තෙරුන් විසින් රචිත ගාථා 621 කින් සමන්විත **සද්ධම්මොපායන** නම් කෘතිය සිංහල භාෂාවෙන් අර්ථ නිරූපණය කරමින් රචනා කිරීම ද උන්වහන්සේගේ ශාස්ත්‍රීය සේවාවේ උත්කෘෂ්ට බව කියාපාන්නකි. **සද්ධම්මොපායන,** සද්ධම්ම උපායන, සඳහම් පඬුර; යනාදි අර්ථයන්ගෙන් හැඳින්වෙන **සද්ධම්මොපායනය** හෙවත් සඳහන් පඬුර අභයගිරිවාසි ආනන්ද ස්ථවිරයන් විසින් "ඉති භදන්ත ආනන්දථේරෙන කතං සද්ධම්මොපායනස්ස සඤ්ඤාකරණං සමත්තං"[65] රචිත බැව් **සද්ධම්මොපායන** ග්‍රන්ථයට කරන ලද සන්නයේ අවසානයේ සඳහන් වෙයි. බුද්ධරක්ඛිත නාහිමියන් **සද්ධම්මොපායනයට** එළුපොතක් කළ බව **සංඝරාජ සාධු චරියාවේ** ද සඳහන් වෙයි.[66] මෙම කරුණුවලින් පැහැදිලි වනුයේ පාළි භාෂාවෙන් තිබුණු **සද්ධම්මොපායන** කෘතිය සිංහල භාෂාවට පරිවර්තනය කිරීම බුද්ධරක්ඛිත හිමියන් සිදු කළ බව ය. එම පරිවර්තනයෙන් හැඟවෙනුයේ උන්වහන්සේ සතු වූ භාෂා දැනුමේ ප්‍රවීණත්වයයි. පාළි ගාථා 621 ක් එහි අන්තර්ගතව තිබූ බව පෙනේ. මෙයට අමතරව **සතිපට්ඨාන සූත්‍රයට** බුද්ධරක්ඛිත හිමියන් විසින් සිංහල අර්ථ සපයා තිබේ. පාලි භාෂාව හා සිංහල

භාෂාව පිළිබඳ මනා පරිචයක් ඇත්තෙකුට කදිම පරිවර්තන කළ හැකි මුත් පැරණි භාෂාවන් පිළිබඳ නිවැරදි අවබෝධයක් නැත්තෙකුට සන්න ලිවීම කළ නොහැකි කාර්යයකි. එම කර්තව්‍යය කළ බුද්ධරක්ඛිත හිමියන් තම හැකියාවන් ප්‍රදර්ශනය කරමින් සිය භාෂාන්තර දැනුම එයින් ප්‍රකට කළේය.

කුරුණෑගල යුගයේ රජ කළ සිව්වැනි පරාක්‍රමබාහු අවධියේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ මධ්‍ය කාලය තෙක් ඓතිහාසික කරුණු ඇතුළත් කරමින් රචිත **මහාවංසයත්**, බුදුරජාණන් වහන්සේගේ නව අරහාදි බුදුගුණ අතුරින් 'සත්ථා' නම් බුදුගුණය පැහැදිලි කරමින් බණ කීමේ කලාව සමාජ ගත කළ **සද්ධමාවවාද සංග්‍රහයත්**, දේවානම්පිය තිස්ස රජ අවධියේ සිට කීර්ති ශ්‍රී රාජසිංහ රජුගේ රාජ්‍යාවසානය තෙක් මෙරට ශාසනික ප්‍රවෘත්ති ඇතුළත් කරමින් රචිත **ශ්‍යාමොපසම්පදාවත** නම් කෘතියත්, **සතිපට්ඨාන සූත්‍රයට** කරන ලද **සිංහල සන්නයත්**, **සද්ධම්මොපායන** ග්‍රන්ථය සිංහලයට පරිවර්තනය කිරීමත් යන ශාස්ත්‍රීය කෘතීන් තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත නාහිමියන්ගේ ඉතිහාසය පිළිබඳ, ධර්මය පිළිබඳ හා භාෂා ශාස්ත්‍රය පිළිබඳව දැනුම හා අවබෝධය ප්‍රකට කරන ප්‍රයත්නයන් ලෙස පෙන්වා දිය හැකිය. **මහාවංසය** වැනි ඓතිහාසිකමය කරුණු අන්තර්ගත කෘතියක් පාළි භාෂාවෙන් රචනා කිරීම සඳහා උන්වහන්සේට ම තත් අවධියේ පවරන්නට ඇත්තේ උන්වහන්සේ සතු වූ මේ භාෂා දැනුමත් ඓතිහාසික මූලාශ්‍ර පිළිබඳ දැනුමත් නිසා වන්නට ඇත. ඓතිහාසික කරුණු රචනා කරන්නවුන්ට පැරණි භාෂා පිළිබඳ දැනුම අත්‍යාවශ්‍ය කරුණකි. එම දැනුම උන්වහන්සේ සතු වූ හෙයින් පැරණි මූලාශ්‍ර අධ්‍යයනය කරමින් උන්වහන්සේ මෙබඳු භාරධූර කටයුත්තක් සම්පූර්ණ කරන්නට යෙදුණු බව කිව යුතු ය. තත් අවධියේ පාලි භාෂාව පිළිබඳව දැනුමකින් සිටි බුද්ධිමත් තෙරවරුන් අතුරින් බුද්ධරක්ඛිත නාහිමියන්ට මේ ඓතිහාසික කෘතිය රචනා කිරීමට ආරාධනා කිරීම තුළින් ගම්‍ය වනුයේ නුවර යුගයේ පාලි භාෂාව දන්නවුන් අතුරින් උන්වහන්සේ ඉදිරියෙන් සිටි බව ය. ඉහත දැක් වූ ශාස්ත්‍රීය කටයුතුවලින්-උන්වහන්සේගේ ජීවිතය පිරීපුන් අතර තත් කාර්යයන් නිසාම උන්වහන්සේ අදටත්



විද්‍යාර්ථීන්ගේ ගෞරවාදරයට ලක්වෙන යතිවරයෙකු ලෙස හැඳින්විය හැකිය.

### ❖ පාලි, සංස්කෘත හා සිංහල යන භාෂා සම්බන්ධයෙන් උන්වහන්සේ දැක් වූ හැකියාව

බුද්ධරක්ඛිත හිමියන් පාලි භාෂාව චතුර ලෙස හැසිරූ ආකාරය **මහාවංසයෙන්** හෙළි වෙයි. **මහාවංසයේ** මුල් පරිච්ඡේදවල පාළි පද්‍ය බන්ධනය කිසියම් රටාවකට අනුව රචනා වූ නමුත් කාව්‍යමය ස්වරූපයක් ගත්තේ නැත. ග්‍රන්ථයේ මුල් රචනා ශෛලීය ඒ ආකාරයෙන් ම සිය රචනාව තුළ ද අනුගමනය කිරීම ට බුද්ධරක්ඛිත හිමියන් උත්සාහ ගත්ත ද උන්වහන්සේ සිය රචනාවේ දී කාව්‍යමය ස්වරූපයකින් පාළි ගාථා බන්ධනය කිරීමට රුචිකත්වයක් ගත්බව ග්‍රන්ථයේ එන ගාථා බන්ධනයන්ගෙන් පැහැදිලි වෙයි. ඡන්දස් ශාස්ත්‍රය මෙන්ම අලංකාර ශාස්ත්‍රය පිළිබඳව මනා පටුත්වයක් උන්වහන්සේ සතුව පැවති බවට නිදසුන් රැසක් **මහාවංසයේ** ඇතුළත්ව තිබේ.

'පාසාදබොධිවරවඩ්කමමණ්ඩපෙහි - පාකාරසාලපටිමාලයචෙතියෙහි
කල්‍යාණිනාමනගරී රුචිරාපණෙහි- රාජෙතිවාරුතරගොපුරතොරණෙහි[67]

මෙම ගාථාවෙන් ඡන්දස් ශාස්ත්‍රය පිළිබඳව හා විවිධ අලංකාර ශාස්ත්‍ර පිළිබඳව උන්වහන්සේ සතු වූ දැනුම මනාව පැහැදිලි වෙයි. උන්වහන්සේ ගාථා බන්ධනයේදී 'වසන්ත තිලකා' වෘත්තයට (වසන්ත තිලකා වෘත්තය ත, බ, ජ, ජ, ගුරු දෙකකින් යුක්ත වෙයි) වැඩි රුචියක් දක්වා ඇති බව දක්නට ලැබෙන අතර ඒ බව ඉහත දක්වා ඇති ගාථාවෙන් ම පැහැදිලි වෙයි. එසේම උන්වහන්සේ අලංකාර ශාස්ත්‍රයේ එන 'යති' තැබීමේ කුසලතාවය ද මැනවින් කාව්‍යකරණයේදී භාවිත කළ බවට එම ගාථාව ම නිදසුන් සපයයි. එම පරිච්ඡේදයේ ම එන 06 - 16 - 18 - 19 - 20 ආදි ගාථා ද ඡන්දස් අලංකාර සහිතව බන්ධනය කළ ගාථා ලෙස පෙන්වාදිය හැකිය.[68] ඇතැම් විටෙක උන්වහන්සේට **දාඨාවංසයේ** එන ගාථා බන්ධනයන්ගේ ආභාසයක් **මහාවංස** රචනයේ දී



ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය
16 JUL 2015

ලැබෙන්නට ඇතිදෝ යන සැකය මේ ගාථා දෙස බැලීමෙන් ඇති වෙයි. මෙයට පෙර රචිත **මහාවංසයේ** සෙසු කොටස්වල පරිච ඡේද අවසානයේ එන ගාථාවන් හැර සෙසු ගාථා පේළි දෙකේ ගාථාවන්ගෙන් යුක්ත විය. නමුත් එම ශෛලීය බුද්ධරක්ඛිත හිමි යන් වෙනස් කරමින් පේළි හතරේ ගාථා සමූහයක් **මහාංවස** යට ඇතුළත් කර තිබේ. එබඳු ලක්ෂණ සහිත ගාථා සමූහයක් 97 වැනි පරිච්ඡේදයේ ඇතුළත් වෙයි.[69] එය **මහාවංසයේ** දී අනුගමනය කළ නව වෙනසක් ලෙසින් පෙන්වාදිය හැකිය. මෙයට පෙර කතුවරු -න් එම ක්‍රමවේදය අනුගමනය කර තිබුණේ නැති තරම්ය. දිගු ගාථා බන්ධනය ලෙහෙසි කටයුත්තක් නොවෙයි. එවැනි දිගු ගාථා බන්ධනයට ඡන්දස පිළිබඳව මෙන්ම අලංකාර රීති පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. තමන් සතු වූ එම හැකියාව ප්‍රයෝජනයට ගෙන බුද්ධරක්ඛිත හිමියන් විසින් මේ නව රීතිය අනුගමනය කර තිබේ. එම ක්‍රමවේදය සාමාන්‍ය පාඨකයාට අදහස ග්‍රහණය කර ගැනීමේ දී තරමක් පැටලුම් සහගත වුව ද ඡේකයන්ගේ පැසසුමට ලක්වෙන බන්ධනයක් ලෙස ඇගයිය හැකිය.

රාජාධිරාජසිංහ අවධියේ ඇසළ මාසයේ පැවැත් වූ ඇසළ පෙරහැර පිළිබඳව විස්තර කථනයක යෙදෙන බුද්ධරක්ඛිත හිමි යන් පෙරහැරෙහි පැවති අංග හා එහි චමත්කාර ජනක බව නව ශෛලියකින් විස්තර කර තිබේ. ''නානානාටක සඞ්කිණ්ණ''[70] යනු වෙන් පටන් ගන්නා ගාථා පහෙන් ඒ බව පැහැදිලිය. මෙම ගාථා කාව්‍යමය ලක්ෂණයන්ගෙන් යුක්ත වන අතර අසන්නාගේ කන් පිනවන බන්ධනයක් ලෙසින් ද සැලකිය හැකිය. ඇතැමුන්ට මෙහි දී අනුගමනය කර ඇති රීතිය ගාථා බන්ධනයේ දක්නට ලැබෙන දුර්වල පද බැඳුමක් ලෙස තර්ක කළ හැකි නමුත් එම රීතිය උන්වහන්සේට ම ආවේණික වූ රීතියක් ලෙසින් සැලකිය හැකිය. පාලි භාෂාව තමන්ට රුචි ආකාරයෙන් හැසිරවීමේ තිබූ හැකියාව මෙයින් පිළිබිඹු කෙරේ.

'ධර්මානිශංසය, සම්බුද්ධගුණ, සද්ධර්මගුණ, සංඝගුණ, සර ණාගමන, අකුසලකර්මපථ, අකුසලකර්ම භූමි, ශීලවිභාගානිශංස ය, කුසලකර්මපථ, කුසලකර්මඵලභූමි, රාජධර්ම, ගෘහපතිධර්ම විභාග හා ධර්මානුශාසන' ආදි වශයෙන් පරිච්ඡේද දහතුනකින්



සමන්විත **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය** බුද්ධරක්ඛිත නාහිමියන්ගේ පාලි, සංස්කෘත හා සිංහල යන භාෂාත්‍රය පිළිබඳ කෞශල්‍යය විදහා දක්වන කැඩපතක් ලෙස පෙන්වාදිය හැකිය. එසේම තත් ග්‍රන්ථය තුළින් ශ්‍රී සද්ධර්මය පිළිබඳව උන්වහන්සේ සතුව පැවති ධර්මඥානය මැනවින් ප්‍රකට කරයි. උන්වහන්සේ ග්‍රන්ථය ආරම්භ කරනුයේ තෙරුවන් වන්දනා කිරීමක් සහිත පාළි ගාථාවකින් ය. බණ කීමේ කලාව අනුගමනය කරමින් කරන ලද ග්‍රන්ථයක් හෙයින් ධර්ම කරුණු පැහැදිලි කරනු වස් පාළි ගාථා රැසක් ග්‍රන්ථයෙහි ඇතුළත් කොට තිබේ.[71] මේ පිටුවලට අමතරව පාළි ගාථා සමුදායක් එහි අන්තර්ගතය. ග්‍රන්ථයට ඇතුළත් කර තිබෙන පාළි ගාථා තුළින් හා ධර්ම කරුණු විස්තර කිරීම සඳහා අනු ගමනය කර තිබෙන විවරණ ක්‍රමවේදයෙන් පාලි භාෂාව පිළිබඳව උන්වහන්සේ සතු වූ හැකියාව පිළිබිඹු කරයි.

පාලි භාෂාව හා ව්‍යාකරණය පිළිබඳ උන්වහන්සේ සතු වූ ඥානය 'සත්ථා' නම් පදය පැහැදිලි කිරීමට උන්වහන්සේ ගෙන ඇති ප්‍රයත්නයෙන් ම පැහැදිලි වෙයි. ''සත්ථා'' යන තන්හි සාසු අනුසිට්ඨිමහි යන ධාතු සාසු කල්හි ඕහට ''භූවාදයො ධාතවො'' යන සූත්‍රයෙන් ධාතුසංඥාව ඒ ධාතුහු කෙරෙන් පරව ''සාසාදීහි රත්‍ථු'' යන සූත්‍රයෙන් රත්‍ථු ප්‍රත්‍යයව ''පුබ්බමධොඨිතමස්සරං සරෙ -ණ වියොජයෙ'' යන පරිභාෂා සූත්‍රයෙන් ඒ රත්‍ථුප්‍රත්‍යයා සම් බන්ධි වූ ''රකාරස්ථ සවර පභව.... අන්තයට ''රමහි රනෙතා රාදි නො'' යන සූත්‍රයෙන් ලොප්ව.... අන්තයට ''සත්‍ථුපිතාදිනමා සිස්මිං සිලොපො ච'' යන සූත්‍රයෙන් ආකාරාදෙශ හා සි විභක්ති ලොප්ව ස්වර පැමිණ සිඩ වූ ''සත්ථා'' යන මේ.....' යනාදි වශයෙන් දැක් වෙන ඡේදයෙන් ධාතු, ප්‍රත්‍යය, ලෝපය, ආදේශ ආදි ව්‍යාක රණ රීති අනුගමනය කරමින් බුද්ධරක්ඛිත නාහිමියන් 'සත්ථා' යන පදය නිර්මාණය වී ඇති ආකාරය පැහැදිලි කර තිබේ.[72] **රූපසිද්ධිය** හා **බාලාවතාරය** ආදි පාලි ව්‍යාකරණය ග්‍රන්ථ පිළිබඳ හසළ දැනුමක් උන්වහන්සේ සතු වූ බව 'සත්ථා' නම් පදය නිර්මාණය කරගත් ආකාරය පැහැදිලි කර ඇති ආකාරයෙන් ම තහවුරු වෙයි.

## ❖ බුද්ධරක්ඛිත නාහිමියන්ගේ සඟ පරපුර

ශාසනික ඉතිහාසයට අනුව මහනුවර යුගයේ එක්තරා කාලපරිච්ඡේදයක් අඳුරෙන් වැසී පැවතුනි. **ස්‍යාමෝපසම්පදාවතේ** සඳහන් වන ආකාරයට මේ සඳහා හේතු වූ කරුණු අතර පළමු රාජසිංහයන්ගේ ක්‍රියා කලාපය බෙහෙවින් බලපෑවේය. ඔහු ගෙන ගිය දරදඬු ප්‍රතිපත්තිය නිසා ''බොහෝ කලක පටන් පරම්පරානුගත ව පැවත ආ ශාස්ත්‍ර ධර්ම පොත්පත් ආදියත් උපසම්පදා ආදි වූ ශාසන කෘත්‍යයත් නැති විය.''[73] මෙවැනි ව්‍යසනකාරී පසුබිමක මෙරට භික්ෂු ප්‍රජාවද භික්ෂුත්වයෙන් පරිබාහිර විවිධ කටයුතුවල නියලෙමින් කාලය ගත කළහ. ඒ පිළිබඳ තොරතුරු බෙහෝ මූලාශ්‍රවල සඳහන් වන අතර Robert Knox (රොබට් නොක්ස්)ට අනුව තත් අවධියේ 'තෙරුන්වහන්සේලා හා ගණින්නාන්සේලා' වශයෙන් භික්ෂු කණ්ඩායම් දෙකක් විය.[74] එම ශාසනික පරිහානිය නවත්වා මෙරට භික්ෂු පරම්පරාව නිවැරදි මාර්ගයට ගෙන ඒම සඳහා කටයුතු කළේ වැලිවිට සරණංකර සංඝරාජ හිමියන් ප්‍රමුඛ උන්වහන්සේගේ අතවැසි භික්ෂු පිරිසකි. එම භික්ෂු පිරිස නියෝජනය කළ යතිවරයෙකු වූ තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමියන්ට උපාලි මහතෙරුන්ගෙන් උපසම්පදාව ලැබූ පළමු පස්නමට ඇතුළත් වීමට හැකි වුණි.[75] කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් මල්වතු මහා විහාරයේ මහානායක පදවියත් උපසඟරාජ පදවියත් ලැබූ බුද්ධරක්ඛිත හිමියන් කුරුණෑගල රිදී විහාරයේ ආධිපත්‍යයෙන් ද පිදුම් ලැබීය. ඒ අනුව රිදී විහාරය කේන්ද්‍ර කරගෙන උන්වහන්සේගෙන් පැවත එන සඟ පරපුර ආරම්භ විය.

තිබ්බොටුවාවේ බුද්ධරක්ඛිත හිමියන්ගේ සඟ පරපුර නූතනයේ දී හඳුන්වනු ලබන්නේ රිදී විහාර පරම්පරාව ලෙසිනි. රිදී විහාරයේ සඟ පරපුර සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී මුහුණ දෙන ප්‍රධාන ගැටලුව වනුයේ ඒ සම්බන්ධයෙන් තොරතුරු අඩංගු මූලාශ්‍ර ඉතා අල්ප වීමයි. මහනුවර යුගයේ සිට මෙම විහාර පරම්පරාව සම්බන්ධයෙන් තොරතුරු හමු වුව ද ඊට පෙර අවධීන්හි මෙහි වැඩ සිටි භික්ෂූන් වහන්සේලා පිළිබඳව නිවැරදි වූත් නිශ්චිත වූත් තොරතුරු කිසිවක් හමු වන්නේ නැත. ජනප්‍රවාද



යන්ට අනුව මිහිඳු හිමියන් දවස සිට ම මෙහි භික්ෂූන් වහන්සේලා වැඩ සිටි බව සඳහන් වෙයි.[76] නමුත් ඒ පිළිබඳව නිශ්චිත සාධක හමු වී නොමැත. ක්‍රි. පූ. යුගයට අයත් බ්‍රාහ්මී ලිපි ගණනාවක් මෙම භූමියෙන් හමු වුව ද මෙහි වැඩ විසූ නිශ්චිත භික්ෂු පරම්පරාවක් පිළිබඳ තොරතුරු එයින් අනාවරණය නොවේ. දුටුගැමුණු රජුගේ නිර්මාණ අතර අති උත්කෘෂ්ටතම නිර්මාණය වන රුවන්වැලි මහා සෑ නිර්මාණය සඳහා අවශ්‍ය කරන රිදී ලබාගෙන තිබෙනුයේ වර්තමාන රිදී විහාරය තිබෙන ප්‍රදේශයෙන්ය. රිදී ලැබීම පිළිබඳව දිගු විස්තරයක් **මහාවංසයේ** සඳහන් වෙයි.[77] **රිදී විහාර අස්න, මහාවංසය, ථූපවංසය** ආදී මූලාශ්‍රවල මෙම විහාරය පූජා කිරීම සම්බන්ධ විස්තරයේදී 'ඉන්දගුප්ත' රහතන් වහන්සේ පිළිබඳව සඳහන් වුව ද උන්වහන්සේට විහාරය පූජා කළ බවට සඳහන් නොවෙයි.[78] එම අවධිය වන විට පෞද්ගලික පූජා ක්‍රමයක් නොපැවති නිසා සමස්ත භික්ෂු සංඝයාට විහාරය පූජා කරන්නට ඇතැයි සිතිය හැකිය. ආමණ්ඩගාමිණී අභය රජුගේ රිදී විහාර අභිලේඛනයට අනුව රජු විසින් විහාරයේ සිටි භික්ෂූන්ට කළ පූජාවක් විනා එක් භික්ෂුවකට පූජා කිරීමක් පිළිබඳව සඳහන් නොවෙයි.[79] මෙවැනි මූලාශ්‍රගත කරුණුවලින් ගම්‍ය වනුයේ රිදී විහාරය කේන්ද්‍ර කරගෙන මුල් අවධීන්හි නිශ්චිත භික්ෂු පම්පරාවක් සිටි බවට අනාවරණය නොවන බව ය.

රිදී විහාරය හා බැඳුණු නිශ්චිත සඟ පරපුරක් සම්බන්ධයෙන් අධ්‍යයනය කිරීමේ දී එය මහනුවර රාජ්‍ය සමය හා සම්බන්ධ වන බව මූලාශ්‍ර තුළින් පැහැදිලි වෙයි. දුටුගැමුණු රජු විසින් ඉදි කළ රිදී විහාරය කීර්ති ශ්‍රී රාජසිංහ රජ දවස ප්‍රතිසංස්කරණය කොට 'තිබ්බොටුවාවේ සිද්ධත්ථ' නම් සාමණේරයන්ට පූජා කළ බව **මහාවංසයේ** දැක්වෙයි.[80] **සංඝරාජසාධුචරියාවේ** ද, **සංඝරාජවතෙහි** ද මේ කරුණ සඳහන් වෙයි. මෙම 'සිද්ධත්ථ' නම් භික්ෂූන් වහන්සේ කවුරුන් ද යත්, උන්වහන්සේ අසරණ සරණ සරණංකර සංඝරාජ මාහිමියන්ගේ ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යරත්නය වූ බව "තවද සංඝරාජෝත්තම නාහිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය නම වූ තිබ්බටුවාවේ සිද්ධාර්ථ නායක සාමීද''[81] යන **සංඝරාජසාධුචරියාවේ** එන පාඨයෙන් හා ''සංඝරාජ සාමීන්ගේ දැනු

මිති ශිෂ්‍ය උන්නාන්සේලා අතුරෙන් ගුණ නුවණ පින් ඇති තිබ්බටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත උන්නාන්සේට වටහපත ලැබී පෝයමළු විහාරේ නායක තනතුරුද"[82] යන පාඨයෙන් හෙළිවනුයේ බුද්ධරක්ඛිත හිමියන් සරණංකර සංඝරාජ හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍ය වූ බවත් උන්වහන්සේ මල්වතු විහාරයෙහි මහානායක ධූරයට පත් වූ බවත් ය.

සැරියුත් පිළිවෙළින් බුදුබණ කඩනො කර
වණපොත් කර උගත් සැමටම පළමු කර
සිදුහත් යතිඳු තිබ්බටුවාවේ පවර
අගපත් ගෝලයෙකි සඟරජුගේ පැනසර.[83]

ඉහත කවිය මුංකොටුවේ රාළ අතින් රචනා වූවකි. මෙයින් බුද්ධරක්ඛිත හිමියන් සතු වූ උගත්කමත් උන්වහන්සේ සරණංකර හිමියන්ගේ අගපත් ගෝල නමක් බවත් පැහැදිලි වෙයි.

'සිද්ධාර්ථ බුද්ධරක්ඛිත' හිමියන් මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක පදවිය හෙබ වූ මහානායක ස්වාමීන් වහන්සේ බවත් සඟරජ සරණංකර හිමියන්ගේ ප්‍රධාන ශිෂ්‍යයා බවත් මෙම කරුණුවලින් හෙළිදරව් වෙයි. ඉහත සඳහන් කළ **මහාවංසය,** හා තවත් ලිපි ලේඛනවලින් දැක්වෙන අන්දමට රිදී විහාරය පුද ලැබූ තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිතාභිධාන මල්වතු පාර්ශ්වයේ ප්‍රථම මහානායක මාහිමිපාණන් වහන්සේ රිදී විහාර සඟ පරපුරේ ආදිම කර්තෘවරයාණන් වූ බව පැහැදිලිය.[84] කීර්ති ශ්‍රී රාජසිංහ රජුගෙන් පුද ලද රිදී විහාරයේ මහත් වූ නව කර්ම හා ප්‍රතිසංස්කරණයන් බුද්ධරක්ඛිත හිමියන් විසින් කරන්නට යෙදුණු බව **මහාවංසයේ** දිගු විස්තරයක් වෙයි.[85] මෙම විහාර කර්මාන්තයන් සිදු කළ උන්වහන්සේගේ රුවක් රිදී විහාර චිත්‍ර අතර වෙයි.[86]

"සමගින පවර උප සඟරාජ තනතුර
මහානායක ධූරය ද මල්වතු වෙහෙර"[87]



යන **මන්දාරම්පුරපුවතේ** එන පද්‍යය තුළින් හා ඉහත මූලාශ්‍රතොරතුරුවලින් සිද්ධාර්ථ බුද්ධරක්ඛිත හිමියන් රිදී විහාරයේ ආධිපත්‍යය හා මල්වතු විහාරයේ මහානායක පදවිය පමණක් නොව සරණංකර සංඝරාජ හිමියන්ගේ උප සඟරජ පදවිය ද දැරූ බව පැහැදිලි වෙයි.

බුද්ධරක්ඛිත හිමියන්ගේ අපවත් වීමෙන් පසුව උන්වහන්සේගේ ශිෂ්‍ය පරපුර රිදී විහාරයේ ආධිපත්‍යය හොබවා තිබේ. බුද්ධරක්ඛිත හිමියන්ගෙන් ඇරඹී මේ භික්ෂු පරපුර මල්වතු මහා විහාරයට හා මෙරට භික්ෂු ශාසනයට මහත් වූ කාර්යභාරයක් ඉටු කළ කීර්තිමත් භික්ෂු පරපුරක් ලෙසින් හැඳින්විය හැකිය. එම පරපුරේ යතිවරයන් වහන්සේලා කිහිප දෙනෙකු විසින් ම මල්වතු මහාවිහාරයේ මහානායක ධූරයටත් අනුනායක ධූරයටත් පත්ව තිබේ. වර්තමාන මල්වතු මහාවිහාරයේ මහානායක පදවිය හොබවනු ලබන්නේ ද සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මහානායක හිමියන්ගේ ගෝල පරපුරෙන් පැවත එන යතිවරයන් වහන්සේ නමක් වන තිබ්බොටුවාවේ සිද්ධාර්ථ සුමංගල මහානායක හිමිපාණන් විසිනි. තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක මහාහිමිපාණන් වහන්සේගේ සඟ පරපුරෙහි ව්‍යාප්තිය සිදු වී ඇති ආකාරය පහත ආකාරයෙන් පෙන්වා දිය හැකිය.

**තිබ්බොටුවාවේ සඟ පරපුර**

වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මහානායක මාහිමි
(මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක හිමි)

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර නාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහනායක හිමි
(14 වැනි මහානාහිමි)

පුරිජ්ජල ශ්‍රී සිද්ධාර්ථ මහානායක මාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර නාහිමි සරණංකර

තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහානායක මාහිමි (වර්තමාන)[88]

**රිදී විහාර වංශය** නම් කෘතියේ දැක්වෙන ආකාරයට මහා නාහිමි තනතුරු ත්‍රිත්ත්වයක් මෙම සඟ පරපුරේ යතිවරයන් වහන්සේලා විසින් හොබවා ඇති බව දක්නට පුළුවන.

මෙම භික්ෂු පරපුරෙහි ව්‍යාප්තිය පිළිබඳ මනා විස්තරයක් එච්. එම්. එස්. තුන්දෙණිය මහතාගේ **මහනුවර විහාර වංස** නම් ග්‍රන්ථයේ සඳහන් වෙයි. මුද්‍රණය නොකළ මේ අත්පිටපතින් එතුමා මේ විහාර පරම්පරාවට සම්බන්ධ කරුණු රැසක් අනාවරණය කරගෙන තිබේ. ඉහත සඳහන් කළ විස්තරයට වඩා වැඩි විස්තරයක් එතුමාගේ ග්‍රන්ථයේ ඇතුළත් වන අතර එම ග්‍රන්ථයේ එන ආකාරටය එම සඟ පරපුර පහත එන ආකාරයෙන් දැක්විය හැකිය.

**තිබ්බොටුවාවේ සඟ පරපුර**

වැලිවිට අසරණ සරණ ශ්‍රී සරණංකර සංඝරාජ මාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මහානායක මාහිමි (මල්වතු මහාවිහාරයේ ප්‍රථම මහානායක හිමි)

පොල්පිතිගම සිද්ධාර්ථ අනුනාහිමි, තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ නාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ මේධංකර නාහිමි

මතුරට ධම්මපාල හිමි, තිබ්බොටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ සුමංගල මහානායක හිමි (14 වැනි මහානාහිමි)



බෙන්තොට මෙධංකරහිමි, පුරිජ්ජල සිද්ධාර්ථ මහානාහිමි, තිබ්බොටුවාවේ මේධංකර හිමි,

ඊරියගම ධම්මානන්ද හිමි

අඹන්වැල්ලේ සිද්ධාර්ථ සුමංගල මහානාහිමි

තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල ලේඛකාධිකාරි හිමි, (වර්තමානයේ මහානාහිමි)

අඹන්වැල්ලේ ධම්මානන්ද අනුනාහිමි[89]

තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මාහනායක හිමිපාණන්ගෙන් ආරම්භ වූ රිදී විහාර සඟ පරපුරේ වර්තමාන නායකත්වය හොබවනු ලබන්නේ මල්වතු පාර්ශ්වයේ අතිපූජ්‍ය මහානායක තිබ්බොටුවාවේ ශ්‍රී සුමංගල මහානායක මාහිමිපාණන් විසිනි. මෙම රිදී විහාර භික්ෂු පරපුර ක්‍රි. ව. දහ අටවැනි සියවසේ සිට මේ දක්වා බුද්ධ ශාසනයට මෙන්ම ශ්‍රී ලාංකේය සමාජයට මහත් වූ කාර්යභාරයක් ඉටු කළ සඟ පරපුරක් ලෙස ඇගයීමට ලක් කළ හැකිය. තිබ්බොටුවාවේ සිද්ධාර්ථ බුද්ධරක්ඛිත මාහිමිපාණන් වහන්සේ මල්වතු මහා විහාරයේ මහානායක පදවිය හා උපසඟරජ පදවිය හෙබවීමට අමතරව, ශ්‍රී ලාංකේය ඉතිහාසයට, ශාස්ත්‍රීය ලෝකයට මෙන්ම සංස්කෘතික ක්ෂේත්‍රයට අමිල සේවාවක් සිදු කළ යතිවරයන් වහන්සේ කෙනෙකු ලෙසින් සම්භාවනාවට ලක් වෙයි.

මල්වතු පාර්ශ්වයේ මහානායක ධූරයන් ගණනාවක් රිදී විහාර පරම්පරාව මඟින් ඉසිලීම හරහා රිදී විහාර සඟපර පුර ශ්‍රී ලාංකේය ඉතිහාසය තුළ සුවිශේෂ පරම්පරාවක් වශයෙන් ඉස්මතු වූ බව ඉහත කරුණු තුළින් පැහැදිලි වෙයි. ඉහත ගෙනහැර දැක් වූ කරුණුවලට අනුව රිදී විහාරය ආශ්‍රය කරගෙන මහනුවර සමයේ සිට නිශ්චිත සඟ පරපුරක් විකාශයක් පෙන්නුම් කෙරේ. මහනුවර අවධියේ පරිහානියට පත්ව තිබූ බුදුසසුන නගා සිටුවීම සඳහා බුද්ධරක්ඛිත නාහිමියන් යම් මෙහෙවරක් දැරුවේ ද එම සඟපර පුරේ යතිවරයන් වහන්සේලා එම කර්තව්‍යය තව දුරටත්

ඉදිරියට රැගෙන පැමිණියහ. එම ආගමික හා සාමාජික කර්තව්‍යය වර්තමානයේ දී තිබ්බටුවාවේ සුමංගල මහානායක මාහිමිපාණන් වහන්සේ විසින් අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබයි.

## ආන්තික සටහන්

---

1 **සංඝරාජ සාධු චරියාව**, සංස්. හේන්පිටගෙදර පියනන්ද හිමි, කොළඹ: ඇල්. ගුණරත්න ප්‍රකාශන, 1954, 1954, පිටුව 33.

2 **මන්දාරම්පුර පුවත**, සංස්. ලබුගම ලංකානන්ද හිමි, කොළඹ: සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 1996, පිටුව 92.

3 **ස්‍යාමොපසම්පදාවත**, (සංස්) මාගල්ලාගොඩ ප්‍රඥාතිස්ස හිමි, කොළඹ: බ්‍රෝඩ්වේ යන්ත්‍රාලය, 1945.

4 **සද්ධම්මොපායනය**, සංස්. මීගොඩ කල්‍යාණතිස්ස හිමි, කැලණිය: විද්‍යාලංකාර මුද්‍රණාලය, 1997.

5 කොටගම, වාචිස්සර හිමි, **සරණංකර සංඝරාජ සමය**, කොළඹ: විසිදුනු ප්‍රකාශකයෝ, 2003, පිටු 216 -217.

6 **සද්ධම්මොපායනය**, සංස්. පල්ලේගම සමිත හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, පිටු 21 - 25.

7 **එම**, පිටුව 21.

8 **සංඝරාජ සාධු චරියාව**, 1954, පිටුව 20.

9 **සද්ධර්මාවවාද සංග්‍රහය**, සංස්. වේරගොඩ අමරමොලි හිමි, කොළඹ: රත්නාකර පොත් වෙළඳහල ප්‍රකාශනයකි, 1956, පිටුව 7.

10 මහින්ද සෝමතිලක, ''උඩරට රාජධානියෙහි නායක්කර් පාලන සමය සහ සමකාලීන ශ්‍රී ලාංකේය බුදුසසුන'', **සාරථී**, සංස්. වයි. කේ. තිස්ස බණ්ඩාර සහ තවත් අය, මධ්‍යම පළාත් සභාවේ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව, 2012, පිටුව 43.

11 **මහාවංස** (දෙවන භාගය), සංස්. හික්කඩුවේ සුමංගල හිමි, රොබට් බටුවන්තුඩාවේ, කොළඹ: රත්නාකාර පොත්හල, 1963, පිටුව I.

12 ඩබ්ලිව්. ඉන්ද්‍රකීර්ති සිරිවීර, ''දේශීය ඉතිහාස රචනා සම්ප්‍රදාය'' **ශ්‍රී ලාංකේය ඉතිහාසය**, (වෙළුම 1) සංස්. ඩබ්ලිව් ඉන්ද්‍රකීර්ති සිරිවීර, ඩබ්ලිව්. එම්. කේ.



විජේතුංග, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ (පුද්ගලික) සමාගම, 2012, පිටු 12 - 13., සිරිමා වික්‍රමසිංහ, ''ඓතිහාසික මූලාශ්‍ර'' **අනුරාධපුර යුගය**, සංස්. අමරදාස ලියනගමගේ, රණවීර ගුණවර්ධන, කැලණිය: විද්‍යාලංකාර විශ්ව විද්‍යාලය, 1965, පිටුව 7.

13 **Cūlavamsa II**, ed. Wilhelm Geiger, Colombo: The Ceylon Government Information, 1953, ගා. 136.

14 **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය**, (1 කාණ්ඩය) (1964) (සංස්) හේම වඤ්රාය, කැලණිය: විද්‍යාලංකාර විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 1964, පිටු 52 - 53.

15 **මහාවංසය**, (පෙරවදන) සංස්. ජී. එස්. බී. සේනානායක, කොළඹ: ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, 2005, p xxxii.

16 **ඌනපූරණසහිතො මහාවංසො**, සංස්. පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1959, පිටුව 625.

17 **සංඝරාජ සාධු චරියාව**, 1954, පිටුව 20.

18 **මහාවංසය**, (පෙරවදන) 2005, p xxxii.

19 **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 575.

20 **එම**, පිටු 575 - 580.

21 **එම**, පිටු 603 - 616.

22 **මහාවංසය දෙවන කොටස**, 1963, පිටුව IV.

23 **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 625.

24 **මහාවංසය**, (පෙරවදන) 2005, p xxxii.

25 **එම**, පිටුව 584.

26 **එම**, පිටුව 232.

27 **එම**, පිටු 584 - 585.

28 **එම**, පිටුව, 585.

29 **එම**, පිටුව 584, පරි. 89. ගා 5.

30 **ස්‍යාමොපසම්පදාවත**, 1945, පිටුව 23.

31 **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 213.

[32] **සත්තසහිත දාඨාවංසය**, සංස්, හීනටියණ ධම්මස්කන්ධ හිමි, කොළඹ: කේ. දොන් කෝර්නේලිස් ද සිල්වා මුද්‍රණාලය 1918, පිටු 106 - 107.

[33] **ෆාහියන්ගේ බෞද්ධරාජධානි සහ වන්දනා ගමන් විස්තරය**, (ක්‍රි. 399 - 414), සි. පරි. ඩබ්ලිව්. චාර්ලිස් ද සිල්වා, බත්තරමුල්ල: ජාතික උරුමයන් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය, 2010, පිටුව 105.

[34] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 606.

[35] **එම**, පිටුව 607.

[36] **එම**, පිටුව 619.

[37] Robert Knox, **An Historical Relations of Ceylon**, Colombo: Saman Press, 1958, p. 117.

[38] ඩී. බී. ජයතිලක, **කතිකාවත් සඟරා**, කැලණිය: කැලණිය විශ්වවිද්‍යාල මුද්‍රණාලය, 1955, පිටු 24 - 25.

[39] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 619.

[40] **එම**, පිටුව 622.

[41] **ස්‍යාම වර්ණනාව සහ විල්බාගෙදර මුදියන්සේගේ තානාපති ගමන**, සංස්. මීගොඩ පඤ්ඤාලෝක හිමි, කොළඹ: එස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1998, පිටුව 75.

[42] **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය**, සංස්. වේරගොඩ අමරමොලි හිමි, රත්නාකර පොත් වෙළඳහල ප්‍රකාශනයකි, 1956, පිටුව 6.

[43] **එම**, පිටු 571 - 572.

[44] **එම**, පිටු 9 - 10.

[45] පුඤ්චිබණ්ඩාර, සන්නස්ගල, **සිංහල සාහිත්‍ය වංශය**, කොළඹ: ලේක්හවුස් මුද්‍රණාලය, 1964, පිටුව 421.

[46] **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය**, 1956, පිටුව 572.

[47] මිණිගමුවේ, රතනපාල හිමි, (2004) "තිබ්බටුවාවේ ශ්‍රී සිද්ධාර්ථ බුද්ධරක්ෂිත ප්‍රථම මහානායක මාහිමියන්ගේ ශාස්ත්‍රීය සේවාව", **මල්වතු මහා විහාරය සහ මහ පදවිය**, සංස්. වල්ගොව්වාගොඩ විමලබුද්ධි හිමි ආදි අය, කොළඹ: මධ්‍යම සංස්කෘතික අරමුදල, පිටුව 274.



[48] සන්නස්ගල, **එම**, 1964, පිටුව 421.

[49] **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය**, 1956, පිටු 4 - 5.

[50] **එම**, පිටු 571 - 572.

[51] **එම**, පිටුව 47.

[52] **එම**, පිටුව 310.

[53] **එම**, පිටුව 304.

[54] **එම**, පිටුව 306.

[55] **එම**, පිටු 264 - 282.

[56] **එම**, පිටුව 282.

[57] **එම**, පිටු 283 - 284 - 285.

[58] **එම**, පිටුව 02.

[59] **එම**, පිටු 345 - 346 - 349.

[60] **නිකායසංග්‍රහය**, සංස්. ඩී. පී. ආර්. සමරනායක, කොළඹ: ඇම්. ඩී. ගුණසේන සහ සමාගම, 1996.

[61] සන්නස්ගල, **එම**, 1964, පිටුව 421.

[62] **ස්‍යාමොපසම්පදාවත**, 1945, පිටුව 23.

[63] සන්නස්ගල, **එම**, 1964, පිටුව 421.

[64] **ස්‍යාමොපසම්පදාවත**, 1945, පිටු 27 - 28.

[65] **සද්ධම්මොපායනය**, 1997, පිටුව 12.

[66] **සංඝරාජ සාධු චරියාව**, 1954, පිටුව 20.

[67] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 578.

[68] **එම**, පිටු 579 - 580. මෙහිදී ද උන්වහන්සේ වැඩි වශයෙන් කාව්‍ය බන්ධනය කර ඇත්තේ 'වසන්ත තිලකා' වෘත්තයෙනි.

[69] **එම**, පිටුව 610.

[70] **එම**, පිටුව 606. ගාථා 46 - 51.

[71] **ශ්‍රී සද්ධර්මාවවාද සංග්‍රහය**, 1956, පිටු 1 - 274 - 276 - 281.

[72] **එම**, පිටු 6 - 7.

[73] **සාමොපසම්පදාවත**, 1945, පිටු 22 - 23.

[74] Knox, **Ibid**, 1958, p. 117.

[75] **සාමොපසම්පදාවත**, 1945, පිටුව 37., වාචිස්සර හිමි, **එම**, 2003, 186.

[76] ජේ. බී. දිසානායක, **රටක මහිම රිදී විහාරෙ**, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, 1996, පිටුව 6.

[77] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටු. 146 - 147.

[78] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 150., **ථූපවංසය**, සංස්. එච්.එම්. මොරටුගම, කොළඹ: රත්න පොත් ප්‍රකාශකයෝ 1996, 243., **රිදීවිහාර අස්න අමුද්‍රිතයි**, පිටුව 23.

[79] **Inscriptions of Ceylon, Vol. II, part. 1**, ed. S. Paranavitana, Colomb: Department of Archaeology, 1983, p. 47.

[80] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 632.

[81] **සංඝරාජ සාධු චරියාව**, 1954, පිටුව 33.

[82] **එම**, පිටුව 17.

[83] වාචිස්සර හිමි, **එම**, 2003, පිටුව 215.

[84] **සංඝරාජ සාධු චරියාව**, 1954, පිටුව 33.

[85] **ඌනපූරණසහිතො මහාවංසො**, 1959, පිටුව 632.

[86] එච්. නන්දන, ලීලානන්ද ප්‍රේමතිලක සහ රෝලන්ඩ් සිල්වා, **ශ්‍රී ලංකාවේ බිතු සිතුවම්: රිදී විහාරය**, කොළඹ: ශ්‍රී ලංකා පුරාවිද්‍යා අධිකාරියේ ශත සංවත්සරික ප්‍රකාශනයකි, 1990.

[87] **මන්දාරම්පුර පුවත**, 1996, පිටුව 92.

[88] **රිදී විහාර වංශය**, සංස්. ඉඩම්පිටියේ ධම්මානන්ද හිමි, කර්තෘ ප්‍රකාශනයක්, 1965, පිටුව 29.

[89] එච්. එම්. එස්, තුන්දෙණිය, **මහනුවර විහාර වංසය**, අමුද්‍රිතයි, පේරාදෙණිය විශ්වවිද්‍යාල පුස්තකාලය, 1988, පිටුව 29.